අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref: ED/05/67/01/39 .
ඔබේ අංකය / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2018.08. 1

චක්‍රලේඛ අංක :- 29/2018

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
04 AUG 2018
අලවතුගොඩ
මහනුවර.
ලි. ප. අංකය 6727

සියළුම පළාත් ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම විදුහල්පතිවරුන්,

## රජයේ පාසල්වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරි වේලාවන්

1. රජයේ පාසල්වල සේවයේ නියුතු කාර්ය මණ්ඩලවලට අයත් නිලධරයන්ගේ රාජකාරි වේලාවන් පිළිබඳව මීට පෙර මවිසින් නිකුත් කල සියළුම චක්‍රලේඛ සහ රෙගුලාසි මෙයින් අවලංගු කරනු ලැබේ.

2. රජයේ පාසල්වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධරයන්ගේ රාජකාරි වේලාවන් පළාත් සභාව අනුව වෙනස් වීමද, ඒ සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන ඉල්ලීම්ද සලකා බලා අමප/06/0896/224/028 අංක සහ 2006 මැයි මස 29 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2006, 04/2003 සහ 29/2017 අනුව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 අනුව, පහත සඳහන් ද්විතියික මට්ටමට අයත් නිලධරයන් දිනකට පැය 7 යි විනාඩි 45 ක් සේවයේ යෙදිය යුතුයි.

    I. සංවර්ධන නිලධාරි සේවයට අයත් නිලධරයන්
    II. සංවර්ධන සහකාර/මූල්‍ය සහකාර/සැලසුම් සහකාර සේවයට අයත් නිලධරයන්
    III. තොරතුරු තාක්ෂණ සේවයට අයත් නිලධරයන්
    IV. පුස්තකාලයාධිපති සේවයට අයත් නිලධරයන්
    V. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අයත් නිලධරයන්
    VI. රාජ්‍ය කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) සේවක ගණයට අයත් නිලධරයන් (ලේඛන සහකාර, පරිගණක දත්ත සටහන්කරු, රසායනාගාර සහකාර, තාක්ෂණ පිය සහකාර)

එමෙන්ම, පහත සඳහන් කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට අයත් නිලධරයින් දිනකට පැය 8 කුත් විනාඩි 45 ක් සේවයේ යෙදිය යුතුයි.

    I. කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධරයින්
    II. ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ නිලධරයින් (පාසල් කම්කරු, සනීපාරක්ෂක කම්කරු, රසායනාගාර සේවක, තාක්ෂණික පිය සේවක, පුස්තකාල සේවක)

4. එසේම ඉහත කාල පරාසය තුල නිලධරයින් සේවය කළ යුතු සේම, පාසල් වේලාව පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 වන බැවින් එම කාලයට අනුරූපී ලෙස නිලධරයන්ගේ රාජකාරි වේලාවන් ද තීරණය විය යුතුය. මෙහිදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතු වලට ඉවහල් වන ලෙස මෙම වේලාවන් සකස් කොට ඇති අතර, තනතුරු අනුව රාජකාරි වේලාවන් පහත පරිදි වේ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister: +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary: +94112784811, +94112785162, secretary.education@moe.gov.lk

CamScanner

## රජයේ පාසල්වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරි වේලාවන්

| අනු අංකය | තනතුර | සාමාන්‍ය රාජකාරි වේලාව | සාමාන්‍ය දෛනික රාජකාරි පැය ගණන(දිවා ආහාරය සඳහා පැය ½ කාලයද ඇතුලත්ව) |
|---|---|---|---|
| 1 | සංවර්ධන නිලධාරි | පෙ.ව. 7.30 - ප.ව.3.15 | පැය 7 මිනිත්තු 45 |
| 2 | සංවර්ධන සහකාර/ මූලික සහකාර/ කළමනා සහකාර | පෙ.ව. 7.30 - ප.ව.3.15 | පැය 7 මිනිත්තු 45 |
| 3 | තොරතුරු තාක්ෂණ සේවය | පෙ.ව. 7.30 - ප.ව.3.15 | පැය 7 මිනිත්තු 45 |
| 4 | පුස්තකාලයාධිපති | පෙ.ව. 7.15 - ප.ව.3.00 | පැය 7 මිනිත්තු 45 |
| 5 | රාජ්‍ය කළමනාකරණ සහකාර | පෙ.ව. 7.30 - ප.ව.3.15 | පැය 7 මිනිත්තු 45 |
| 6 | මෙහෙයුම් සහකාර / පරිගණක දත්ත සටහන්කරු | පෙ.ව. 7.30 - ප.ව.3.15 | පැය 7 මිනිත්තු 45 |
| 7 | සහකාර පුස්තකාලයාධිපති | පෙ.ව. 7.15 - ප.ව.3.00 | පැය 7 මිනිත්තු 45 |
| 8 | රසායනාගාර සහකාර | පෙ.ව. 7.15 - ප.ව.3.00 | පැය 7 මිනිත්තු 45 |
| 9 | තාක්ෂණ නිධි සහකාර | පෙ.ව. 7.15 - ප.ව.3.00 | පැය 7 මිනිත්තු 45 |
| 10 | ශිෂ්‍ය නිවාසාධිකාරී | පැය 24 පූර්ණ කාලීන සේවයේ යෙදිය යුතු අතර විදුහල්පති සමඟ සාකච්ඡා කොට වැඩ පිළිවෙල සකස් කර ගත යුතුය. | |
| 11 | සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී/ දරුකැළම් | | |
| 12 | පුස්තකාල සේවක | පෙ.ව. 7.00 - ප.ව.3.45 | පැය 8 මිනිත්තු 45 |
| 13 | රියදුරු | පෙ.ව.7.00 - ප.ව. 4.00 | පැය 9 ක් පූර්ණ කාලීන සේවයේ යෙදිය යුතු අතර විදුහල්පති විසින් රාජකාරි වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව) |
| 14 | මුරකරු | | |
| 15 | රසායනාගාර සේවක/ තාක්ෂණ නිධි සේවක/පාසල් කම්කරු/ සනීපාරක්ෂක කම්කරු | පෙ.ව. 7.00 - ප.ව.3.45 | පැය 8 මිනිත්තු 45 |

5. එමෙන්ම, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ට පාසල් වාර අවසාන නිවාඩුව හිමි නොවන අතර, සේවා අවශ්‍යතාවය මත සේවයට කැඳවීම හෝ නිවාඩු ලබා දීම විදුහල්පතිගේ අභිමතය පරිදි සිදු කළ හැක. කෙසේ වෙතත් අධ්‍යයන කටයුතු සඳහා පාසල් වාරය ආරම්භ වීමට පෙර පාසල් පරිසරය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට උචිත පරිදි සකස් කිරීම සඳහා පාසල් වාර නිවාඩුවේදී අනධ්‍යයන කාර්ය මණ්ඩලය මෙහෙයවීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.

6. මෙම චක්‍රලේඛය 2018 අගෝස්තු මස 02 දින සිට ක්‍රියාත්මක වේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය